# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2122/25 - 2019 මැයි මස 08 වැනි බදාදා - 2019.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xvi) (ඒ)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 23 (2) වන වගන්තිය සමග කියවිය යුතු 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2019 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

01. මෙම නියමාවලිය 2019 අංක 02 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. 2017 ජුනි මස 06 වැනි දින අංක 2022/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත පරිදි වූ, 1990 ජනවාරි මස 05 වැනි දින අංක 591/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1990 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලියේ 16 වන ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (1) වන අනු ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(1) විවෘත විශ්වවිද්‍යාලයේ පහත දැක්වෙන පීඨ තිබිය යුතු ය :-

(*අ*) මානව හා සමාජ විද්‍යා පීඨය ;
(*ආ*) ස්වභාවික විද්‍යා පීඨය ;


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) ඉංජිනේරු තාක්ෂණ පීඨය ;
(ඈ) අධ්‍යාපන පීඨය ;
(ඉ) සෞඛ්‍ය විද්‍යා පීඨය ; සහ
(ඊ) කළමනාකරණ අධ්‍යයන පීඨය." ;

(2) එහි (2) වන අනු ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(2) මානව හා සමාජ විද්‍යා පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය :-

(අ) අධ්‍යාපන ;
(ආ) නීති අධ්‍යයන ;
(ඇ) භාෂා අධ්‍යයන ; සහ
(ඈ) සමාජ විද්‍යා අධ්‍යයන." ;

(3) එහි (6) වන අනු ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :-

"(6අ) කළමනාකරණ අධ්‍යයන පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය :-

(අ) සංවිධාන අධ්‍යයන ;
(ආ) ගිණුම්කරණ සහ මූල්‍ය ;
(ඇ) මානව සම්පත් කළමනාකරණ ; සහ
(ඈ) අලෙවිකරණ කළමනාකරණ.".

05 - 539

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.